වැලිගෙපොල ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය
------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කර්මාන්තයක් සඳහා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු හා කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු රු. 50,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබීම් හා ගෙවීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | අතපසු වීමකි. ඉදිරියේදී මෙවන් අවස්ථාවන් මඟ හරවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 843,254 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සැසඳිය යුතුවේ. | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 204 | 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබූ රු. 43,250 ක් වටිනාකමැති | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ භාණ්ඩ තවදුරටත් ඌණ භාණ්ඩ වශයෙන් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | භාණ්ඩ ඒකක 36 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1988 වර්ෂයේ සිට 2018 නොවැම්බර් දක්වා අවස්ථා 176 කදී ලබාදී තිබුණු එකතුව රු. 2,765,119 ක් වූ විවිධ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද පියවා නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දීර්ඝ කාලයක සිට පැවත එන්නකි. ලබා දී ඇති අත්තිකාරම් මුදලින් පියවීමට හැකි අත්තිකාරම් මුදලක් සොයා ගත නොහැකිය. අත්තිකාරම් මුදල් ගිණුම්ගතකිරිමේදී සිදු වූ ප්‍රමාද දෝෂයන්ද ඇති බව හැඟේ. දැන් එලෙස සිදු නොවේ. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 1998 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලයට අදාල රු. 197,288 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳ සොයාබලා කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,922,468 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,966,680 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම - | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,398,900 | 8,849,065 | 7,735,275 | 5,946,338 | 6,832,725 | 9,076,249 | 7,984,217 | 4,787,515 |
| (ii) | කුලී | 2,591,990 | 1,891,521 | 1,472,020 | 183,158 | 2,340,297 | 1,790,628 | 1,860,149 | 159,072 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,160,250 | 1,469,208 | 1,454,908 | - | 1,155,300 | 1,422,234 | 1,422,234 | - |
| (iv) | වෙනත් ආදායම් | 9,536,000 | 8,275,405 | 11,880,508 | 8,043,012 | 8,939,900 | 8,348,354 | 3,019,897 | 11,541,330 |

**2.2.2** **වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 5,827,830 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වර්ෂ 05 ට වඩා වැඩි කාලයක් හිඟහිට ඇති ඒකක 1172 කට අදාල රු. 3,888,144 ක් පැවතුණි. | දීර්ඝ කාලයක සිට පවතින හිඟ ආදායම් රැස්කර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. | හිඟශේෂය තුළ ඇති අඩිබිල් කිරීම් කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ගිණුම් ගැලපීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු. 74,020 ක් වූ අතර, ඒ තුල වර්ෂ 05 ට වඩා පැරණි ඒකක 73 කින් අයවිය යුතු රු. 64,953 ක් පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් බෙදීයාම හා මුල් අයිතිකරුවන් සොයා ගැනීමට නොහැකි වීම වැනි හේතූන් මත හිඟ අක්කර බදු අයකර ගැනිමට නොහැකිව ඇත. බිම් සවිය කාර්යාලයේද සහාය ලබාගෙන සතොෂණයක් සිදුකිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව විසින් ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 05 කට අදාලව 2018 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු. 639,943 ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කොටසක් අයවී ඇති අතර, තවදුරටත් අයවිය යුතුව ඇති හිඟ පාරිභෝගිකයින්ගේ ලැයිස්තු ලබාගෙන ඇති බැවින් අයකර ගැනීමට හෝ විසන්ධි කිරීමට පියවර ගනිමි. |

**2.2.3** **කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව යටත් පිරිසෙයින් වසර 05 කට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කල යුතු වුවත්, කඩකාමර 14 ක බදු කුලිය එලෙස සංශෝධනය කර නොතිබුණි. | කඩකාමර සියල්ල වසර 05 කට වරක් තක්සේරු කර බදු කුලිය සංශෝධනය කළ යුතුවේ. | බදු කුලිය සංශෝධනය කිරීම පිණිස තක්සේරු වාර්තා ලබාදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීම අනුව ඕපනායක කඩකාමර 08 ක් සඳහා නව තක්සේරු වාර්තාවක් ලබා දී ඇත. ඉතිරි ඒවායේද වටිනාකම් ලබා ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආහාර නිෂ්පාදන ආයතන 64 ක් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ ලබා නොගෙන වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. | විධිමත් පරිදි අදාල නිර්දේශ ලබාගෙන වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතුවේ. | බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 50 ක් තුළ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් පරිදි මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරීන් යෙදවීමේ අපහසුතාවය මත විශේෂයෙන් යොමු කළයුතු ව්‍යාපාර අයදුම්පත් සඳහා පමණක් නිර්දේශ ලබාගෙන ඇත. ඉදිරියේදී හැකිතාක් නිර්දේශයන් ලබා ගැනීමට කටයුතු කරමි. |

**2.2.5 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා සමාලෝචිත වර්ෂය සඳහා රු. 300,000 ක ආදායමක් ඇස්තමේන්තුගත කර තිබුණද, කිසිදු ආදායමක් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට අදාළ පියවර ගත යුතුවේ. | උත්සහ කළෙමි. ත්‍රීරෝද රථ සංගම් සමාජිකයින් සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය, පොලිසිය එක්ව ගාල් කිරිමේ ස්ථාන හඳුනාගෙන නියමානුකූලව කටයුතු කරමි. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,083,425 ක් වූ අතර, අයවිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අධිකරණ කාර්යාලවලට නිලධාරින් යවා උපලේඛන සකස් කර යවා ඇත. දැන් ලැබෙමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සෑම වර්ෂයකම අවසන් කාර්තුව තුල ව්‍යාපාර ස්ථාන පිළිබඳ සමීක්ෂණයක් කර ලේඛනගත කිරීමටත්, එම ව්‍යාපාර ස්ථාන සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ ලබා ගැනීමටත් සැලසුම් කර තිබුණද, එපරිදි කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවේ. | දැන් නියමානුකූලව සිදු කෙරේ. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම සැලැස්ම ආදායම් රැස්කිරීමේ හා කාර්යාලයීය කටයුතු වලට පමණක් සීමා වී තිබුණි. බල ප්‍රදේශයේ සංවර්ධනය හා ජනතාවට සපයන සුභසාධන පහසුකම් ඉහල නැංවීම පිළිබඳ යෝජනා කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | සභාවේ සියළු ක්‍රියාකාරකම් හා අංශ ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අනුමත කළ යුතුවේ. | පවත්නා වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම ප්‍රදේශයේ ජනතාවගේ සුබසාධනයට හේතුකාරකයක් වන සේ පිළියෙල කර ඇත. |

### (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | යෝජිත කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | "පිළිසරු ව්‍යාපෘතිය" හා ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සහාය ලබා ගැනීමට අදාල ව්‍යාපෘති වාර්තා, ඇස්තමේන්තු පිළියෙල කොට ඉදිරිපත් කර ඇති බැවින්, විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් හැකිතාක් ඉක්මනින් ආරම්භ කිරීමට හැකිවනු ඇතැයි විශ්වාස කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සකස් කර නොතිබුණි. | දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කිරිමේදී තිරසර සංවර්ධන අරමුණු ඇතුළත් කර ඇත. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 කට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින නිලධාරීන් 05 කට අදාල එකතුව රු. 102,423 ක් වූ ණය ශේෂ පියවා ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි. | හිඟ ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය සියළු පියවර ගත යුතුවේ. | මෙම මුදල් අයකර ගැනීම පිණිස අදාල ආයතන වෙත කිහිප විටක්ම දැනුම් දී ඇත. නැවත දන්වා යවා අයකර ගැනීමට ක්‍රියා කරමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දියුණු ගම් ප්‍රදේශ ඇතුලත්ව නව වරිපනම් තක්සේරුවක් 2014 වර්ෂයේදී සිදුකර තිබුණද, නව ප්‍රදේශ වල තක්සේරුවට විරුද්ධව පැනනැඟුන මහජන විරෝධය හේතුවෙන් එම ප්‍රදේශ වලින් වරිපනම් බදු අයකිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණි. අදාල ප්‍රදේශ සඳහා සපයන මහජන සේවා ප්‍රමාණවත් නොවන්නේ නම් ඒ පිළිබඳ පරීක්ෂා කර ප්‍රමාණවත් සේවාවන් සපයා හෝ වරිපනම් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | නව වරිපනම් තක්සේරුවක් ප්‍රකාශයට පත්කිරීමේදී ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව සිදුකළ යුතුවේ. | දියුණුගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශ වලට සභාව මඟින් සපයන ලද සේවාවන් ප්‍රමාණවත් නොවන බව පවසමින් ප්‍රදේශවාසීන් විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා එම මුදල් කපා හැරීමට සභා තීරණයක් මත විෂයයභාර ගරු අමාත්‍යතුමා වෙත කරන ලද ඉල්ලීම අනුව මේ වන විට, එම බිල් කිරීම් කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. 51,684,257 ක් වූ ජංගම නොවන වත්කම් සභාව සතුව පැවතියද ඊට අදාල වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගියද, එහි ලී බඩු හා සවිකිරීම් ගිණුමට අදාල විස්තර ඇතුළත් කර නොමැත. එකී ගිණුම් සඳහා උපලේඛන සකස් කර ඉදිරිපත් කරමි. |
| (ආ) | වීථි පහන් ලේඛනය විධිමත්ව හා අඛණ්ඩව නඩත්තු කර නොතිබුණි. | වීථි පහන් ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුවේ. | වීථි පහන් ලේඛනය යාවත්කාලීන කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

### 3.4.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැති වීම හේතුවෙන් 2014 වර්ෂයේදී සභාවට ලැබී තිබුණු ගලි බවුසරය ලද දින සිටම නිෂ්කාර්යව පැවතුණි. | ගලි බවුසරය ඵලදායී ලෙස භාවිතයට ගැනීමට හෝ එය ප්‍රයෝජනයට ගතහැකි පළාත් පාලන ආයතනයකට ලබාදීමට කටයුතු කළ යුතුවේ. | විධිමත් අපද්‍රව්‍ය බැහැරලීම පිණිස ස්ථානයක් නොමැති වීම හේතුවෙන් ගලි බවුසරය මෙසේ ප්‍රයෝජනයට නොගෙන ගාල් කර ඇත. දැන් යෝජිත කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියත් සමඟ මළාපවහන පද්ධතියක් ඉදි කිරීමට සැලසුම් කර ඇති බැවින්, මෙය ප්‍රයෝජනයට ගත හැකිවේ යැයි විශ්වාස කරමි. |

### 3.4.3 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 ජුලි මස 17 වන දින අනතුරකට ලක්වී තිබුණු කැබ් රථය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. කැබ් රථය අළුත්වැඩියා කර තිබුණද, ඊට අදාලව ලැබිය යුතු රක්ෂණ වන්දි සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ලැබී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, ලැබිය යුතු රක්ෂණ වන්දි අයකරගත යුතුවේ. | වැඩි ප්‍රමාණයක් ලැබී ඇත. ඉතිරි මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 සැප්තැම්බර් 02 දින කසළ ඉවත්කිරීමේ කටයුතු අතරතුරදී අනතුරට පත්වූ ට්‍රැක්ටරය ආරක්ෂක ක්‍රම අනුගමනය නොකර වාහනය පිටුපසට යාමේදී සිදුවූ අනතුරක් වීම හේතුවෙන් අලාභය ප්‍රතිපූර්ණය කල නොහැකි බව රක්ෂණ සමාගම දන්වා තිබුණි. මුදල් රෙගුලාසි අංක 104 ප්‍රකාරව කටයුතු කර අලාභ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තවදුරටත් පියවීමට ඇත්තේ සුළු මුදලකි. අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | වසර 05 කට වැඩි කාලයක සිට ධාවන තත්ත්වයේ නොපවතින කැබ් රථ 02 ක් හා ට්‍රැක්ටර් 03 ක් අපහරණය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | ධාවන තත්ත්වයේ නොපවතින වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කැබ් රථ දෙක සඳහා සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ තක්සේරු වාර්තාවක් ලබාගෙන විධිමත් ක්‍රමවේදය අනුව වෙන්දේසි කිරීමටත්, අත්ට්‍රැක්ටර් රථවල ලියාපදිංචි සහතික ලබා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරමි. |

### 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | පිළියෙල කිරීමට කටයුතු කරමි. |

### 3.5.2 සැපයීම් හා සේවා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල ව්‍යාපෘති සඳහා ජල මනු 300 ක් මිලදී ගැනීමට 2018 මැයි 21 දින ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා තිබූ අතර, තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් විධිමත් ඇගයීමක් සිදු නොකර 2018 සැප්තැම්බර් 11 දින රු. 340,000 ක් වැයකර ජල මනු 100 ක් මිලදී ගෙන තිබුණි. | භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුවේ. | මුල් අවස්ථාවේදී ජල මනු 100 ක් පමණක් මිලදීගනු ලැබුවේ එම අවස්ථාවේ සභාවේ පැවති මූල්‍ය තත්ත්වය මත බව දන්වා සිටිමි. |
| (ආ) | මිල ගණන් කැඳවීමට පෙර සකස් කර තිබූ පිරිවිතර වල ජල පෙරනයක් සහිත වියයුතු බවට දක්වා නොතිබුණු නමුත් මිලදීගත් ජල මනු වල පෙරනයක් තිබීම හේතුවෙන් එම ජල මනු මිලදී ගැනීමට තීරණය කර තිබුණි. එමෙන්ම ව්‍යාපෘතියට අවශ්‍ය ජල මනු ප්‍රමාණය හා ඒවායේ තිබිය යුතු පිරිවිතරයන් ඇගයීම සඳහා | භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුවේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සුදුසු ගැනුම්කරුවෙකු තෝරාගනු ලැබුවද තවදුරටත් ගුණාත්මක බව තහවුරු කරගැනීම සඳහා භෞතික පරීක්ෂාවක් සිදුකළ බව දන්වා සිටිමි. |

ඇගයීම් කමිටුවක් පත්කර නොතිබීම හේතුවෙන් මිලදීගත් ජල මනු අදාල ව්‍යාපෘතියේ භාවිතයට සුදුසු ද යන්න ගැටළු සහගත විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 20 කට අදාලව එකතුව රු. 5,683,200 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කළ යුතු අතර, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | වියදම් වේයැයි සිතා ඇස්තමේන්තු කරනු ලැබුවද, වියදම් පාලනය කිරීම හේතුවෙන් මුදල් ඉතිරි විය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 22 කට අදාලව එකතුව රු. 13,947,232 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 54 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කළ යුතු අතර, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | වියදම් වේයැයි සිතා ඇස්තමේන්තු කරනු ලැබුවද, වියදම් පාලනය කිරීම හේතුවෙන් මුදල් ඉතිරි විය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 පළමු කාර්තුවට අදාළව විගණන කළමනාකරණ කමිටුව චක්‍රලේඛ ප්‍රකාරව පවත්වා ඇත. |